පුනරීක්ෂණ අභ්‍යාස

ප්‍රවේශ මාර්ග කොටසක් සඳහා 60mm ඝණකම සහිත 4m දිග හා 800mm ක් පළලින් යුතු කොන්ක්‍රීට් කොටසක් යෙදීමට සිදුව ඇත.

මේ සඳහා පෙදරේරුවෙකුට හා සහයක ශිල්පියෙකුට දින $^1/_2$ ගතවන අතර ශ්‍රේණිය 15 වන කොන්ක්‍රීට් අවශ්‍යය.

එය ඝන මීටරයක් සෑදීම සඳහා සිමෙන්ති 227 kg ක්, වැලි 0.46 m^3 ද ගල් 0.92m^3 අවශ්‍ය බව සඳහන්ය.

පෙදරේරුවෙකුගේ දිනක වැටුප	රු. 2000.00
සහයක ශිල්පියෙකුගේ දිනක වැටුප	රු. 1500.00
සිමෙන්ති කොට්ටයක මිල	රු. 1000.00
වැලි ඝන මීටරයක (1 m^3) මිල	රු. 6000.00
ගල් ඝන මීටරයක (1 m^3) මිල	රු. 2200.00 යි

1) ඉහත කොන්ක්‍රීට් කොටසේ පරිමාව සොයන්න. (1)
2) කොන්ක්‍රීට් සඳහා අවශ්‍ය සිමෙන්ති කොට්ට කොපමණද? (1)
3) කොන්ක්‍රීට් සඳහා අවශ්‍ය වැලි හා ගල් ප්‍රමාණය සොයන්න. (2)
4) ශ්‍රමය සඳහා වැයවන මුදල සොයන්න. (1)
5) අමු ද්‍රව්‍ය සඳහා වැයවන මුදල සොයන්න. (1)
6) උඩිස් වියදම 20% ක් නම් සම්පූර්ණ කාර්යය අවසන් කිරීම සඳහා වැය වන මුදල ගණනය කරන්න. (4)